# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන)

**ප්‍රදාන පත්‍ර හෝ නීයාදන සාධන පත්‍ර මත රජයේ ඉඩම් දරනු ලබන පුරවැසියන්ට එම ඉඩම් සඳහා පරම අයිතිය ප්‍රදානය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2019 ජුනි මස 28 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 මාර්තු මස 27 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[283 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 40.00** **තැපැල් ගාස්තුව : රු. 20.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්. ඩී.—ඕ. 49/2015

**ප්‍රදාන පත්‍ර හෝ නීයාදන සාධන පත්‍ර මත රජයේ ඉඩම් දරනු ලබන පුරවැසියන්ට එම ඉඩම් සඳහා පරම අයිතිය ප්‍රදානය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා වූ ද පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.*

**1.** මේ පනත 2019 අංක        දරන රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මඟින් නියම කරනු ලබන (මෙහි මින් මතු “නියමිත දිනය” යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

*පනතේ කාලසීමාව.*

**2.** මෙම පනත අවුරුදු හතක කාලයක් සඳහා ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### පනත අදාළවීම

*මෙම පනත යටතේ සුදුසුකම් සඳහා වන නිර්ණායක.*

**3.** (1) මෙම පනතේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනට අවුරුදු දහයකට වඩා වැඩි කාලයක්-

(අ) ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන යටතේ ප්‍රදාන පත්‍රයක් දරන තැනැත්තකු;

(ආ) ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ නීයාදන සාධන පත්‍රයක් දරනු ලබන තැනැත්තකු; හෝ

(ඇ) ඉඩම් නිරවුල් කිරීමේ වැඩසටහනක් යටතේ හෝ ජනපද ව්‍යාපාරයක් යටතේ කෘෂිකාර්මික කටයුතු සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ නීයාදන සාධන දරනු ලබන තැනැත්තකු,

සඳහා මෙම පනතේ විධිවිධාන අදාළ විය යුතු අතර එම තැනැත්තා මෙහි මින්මතු “ඉල්ලුම්කරු” යනුවෙන් සඳහන් කරනු ලැබේ፡

එසේ වුවද, (අ) සහ (ආ) ඡේද යටතේ වන ඉල්ලුම්කරුවකු අක්කර පහක ප්‍රමාණයක් දක්වා මෙම පනතේ විධිවිධාන යටතේ පරම ඉඩම් ප්‍රදානයක් ලබා ගැනීම සඳහා සහ ඒ සඳහා ඉල්ලුම් කිරීම සඳහා සුදුස්සකු විය හැකි ය. එකී ඉඩමේ යම් ප්‍රමාණයක් ඉතිරිව ඇත්නම්, එම ඉතිරි ප්‍රමාණය, ඉල්ලුම්කරු විසින් 28 වන වගන්තියේ අතුරුවිධානය යටතේ විධිවිධාන සලසා ඇති පරිදි, එහි මායිම් සහ සීමා වෙන් වෙන්ව නියම කරමින්, අදාළ ඉඩම් ප්‍රදානය හෝ නීයාදන සාධන පත්‍රය යටතේ දරනු ලැබිය යුතු ය.

(2) මෙම වගන්තියේ කාර්ය සඳහා, "ඉල්ලුම්කරු" සඳහා (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අදාළ වන නීති යටතේ වන නාමිකයකු, ප්‍රදාන ලාභියකු, හෝ අනුප්‍රාප්තිකයකු ඇතුළත් වන අතර ප්‍රදානයේ හෝ නීයාදන සාධන පත්‍රයේ සඳහන් දින සිට අවුරුදු දහයක කාලය ගණනය කරනු ලැබිය යුතු ය.

පනත අදාළ නොවන ප්‍රදේශ.

4. රජයේ ඉඩම්-

(අ) මුහුදු මට්ටමෙන් මීටර් එක්දහස් පන්සිය විසිහතරකට වඩා වැඩි මධ්‍යස්ථ උස් මට්ටමක පිහිටා ඇති;

(ආ) තත්කාලයේ බලාත්මකව පවතින යම් ලිඛිත නීතියක් යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කර ඇති;

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ රක්ෂිතයක් හෝ ආරක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කළ ප්‍රදේශයක් තුළ ඇති;

(ඈ) නීතිය මඟින් යම් පළාත් පාලන ආයතනයක් වෙත පවරා ඇති;

(ඉ) නාගරික හෝ ග්‍රාමීය පුනර්වර්ධන ව්‍යාපෘති, නාගරික හෝ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති, යටිතල පහසුකම් ව්‍යාපෘති හෝ නිවාස ව්‍යාපෘති ඇතුළුව පළාත් පාලන ආයතන විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද;

(ඊ) යම් නැවත පදිංචි කිරීමේ වැඩ සටහනක් යටතේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පිහිටා ඇති,

අවස්ථාවන්හි දී මෙම පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

ඉල්ලුම්කරුවකු වීමට සුදුස්සකු නොවීම.

**5.** (අ) (68 වන අධිකාරය වූ) කාලාවරෝධී ආඥාපනත යටතේ එකී රජයේ ඉඩමක් සඳහා කාලාවරෝධී හිමිකම ඉල්ලා සිටීමක දී;

(ආ) නිකුත් කර ඇති ප්‍රදානය හෝ නීයාදන සාධන පත්‍රය යටතේ වූ කොන්දේසි ඉටුකිරීමට අපොහොසත් වීමක දී;

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ සඳහන් වන යම් කොන්දේසි කඩ කිරීමක දී;

(ඈ) වංචනික ආකාරයෙන් ලබාගත් ප්‍රදානයක දී; හෝ

(ඉ) රජයේ ඉඩමක් සම්බන්ධයෙන් වන ආරාවුලක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ ලිඛිත නීතිය යටතේ පිහිටුවන ලද යම් අධිකරණයක්, ආයතනයක්, විනිශ්චය අධිකාරියක් හෝ අධිකාරියක් ඉදිරියේ විභාග වෙමින් පවතින අවස්ථාවක දී,

යම් තැනැත්තකු පරම ඉඩම් ප්‍රදානයක් සඳහා වන ඉල්ලීමක් කිරීම සඳහා නුසුදුස්සකු විය යුතු ය.

## II වන කොටස

## ඉඩම් ප්‍රදාන කමිටුව සහ අනු කමිටුව

ඉඩම් ප්‍රදාන කමිටුව මෙම පනතේ පරිපාලනය සිදු කළ යුතු ය.

**6.** (1) මේ පනතේ පරිපාලනය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන ඉඩම් ප්‍රදාන කමිටුව (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් සිදුකරනු ලැබිය යුතු ය:—

(අ) ඉඩම් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ආ) වනිතා කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ඇ) කෘෂිකර්ම විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ඈ) පළාත් පාලන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ඉ) ගොවිජන සේවා විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ඊ) වනාන්තර විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(උ) වන ජීවී විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ඌ) වැවිලි විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(එ) ජාතික ප්‍රතිපත්ති විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම් වරයාගේ නියෝජිතයකු;

(ඒ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ඔ) ස්වදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ඕ) තිරසාර සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ක) සංවර්ධන ක්‍රමෝපාය මාර්ග විෂයයපවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ග) පරිසර විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ච) මහවැලි සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් තනතුරට වඩා අඩු නොවන තනතුරක් දරන ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ජ) (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ පත්කළ ඉඩම් කොමසාරිස්වරයා හෝ ඉඩම් කොමසාරිස් ලෙස වැඩබලන තැනැත්තකු;

(ට) ශ්‍රී ලංකාවේ මිනුම්පතිවරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(ඩ) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ පත්කළ ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා;

(ණ) රාජ්‍ය සේවකයකු විය යුතු සහ ඉඩම් කටයුතු සම්බන්ධයෙන් අවුරුදු දහයකට අඩු නොවන පළපුරුද්දක් සහිත ජනාධිපතිවරයාගේ නියෝජිතයකු;

(ත) රාජ්‍ය සේවකයකු විය යුතු සහ ඉඩම් කටයුතු සම්බන්ධයෙන් අවුරුදු දහයකට අඩු නොවන පළපුරුද්දක් සහිත අග්‍රාමාත්‍යවරයාගේ නියෝජිතයකු.

(2) කමිටුව විසින් මෙම පනත යටතේ පවරා ඇති සියලු කටයුතු සිදුකළ යුතු අතර, අවශ්‍ය වූ විට-

(අ) අමාත්‍යවරයාට නිර්දේශ ලබා දීම;

(ආ) යම් තැනැත්තකුගෙන්, රාජ්‍ය ආයතනයක නිලධරයකුගෙන් හෝ විශේෂඥයකුගෙන් යම් ලේඛනයක් හෝ පැහැදිළි කිරීමක් ලබා ගැනීම;

(ඇ) යම් ප්‍රමාණයක අනු කමිටු පත්කිරීම;

(ඈ) පනතේ පරිපාලනය සඳහා විශේෂ හෝ සාමාන්‍ය විධාන ලබා දීම;

(ඉ) දත්ත පද්ධතියට ඇතුළත් කළ යුතු අවශ්‍ය ආකෘති පත්‍ර, අයදුම්පත් සහ අනෙකුත් ලේඛන සැකසීම,

කළ යුතු ය.

(3) (මෙහි මින් මතු "සභාපතිවරයා" වශයෙන් හඳුන්වනු ලබන) ඉඩම් කොමසාරිස් කමිටුවේ සභාපතිවරයා විය යුතු ය.

කමිටුවේ ගණපූරණය, පාරිශ්‍රමික ආදිය.

**7.** (1) කමිටුවේ ගණපූරණය, තැනැත්තන් නව දෙනෙකු විය යුතු ය.

(2) කමිටුවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවැතිය ද, එය නොසලකා හරිමින් ක්‍රියා කිරීම සඳහා කමිටුවට බලය තිබිය යුතු අතර, යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ යම් සාමාජිකයකු පත්කර ගැනීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව නිසාම පමණක් කමිටුවේ යම් ක්‍රියාවක්, ක්‍රියා පටිපාටියක් හෝ තීරණයක් අවලංගු බවට සලකනු නොලැබිය යුතු ය.

(3) කමිටුව විසින් කමිටුවේ රැස්වීම් සම්බන්ධ ක්‍රියා පටිපාටි සහ එකී රැස්වීමට අදාළ කටයුතු විධිමත් කළ යුතු ය.

(4) (අ) කමිටුවේ සියලු තීරණ කමිටු රැස්වීමක දී ලබාගත යුතු අතර, එම රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

(ආ) රැස්වීමේදී සලකා බලනු ලබන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් හිමිව ඇති ඡන්ද ප්‍රමාණය සමාන වන විට දී එම රැස්වීම සඳහා වන සභාපතිවරයාට ඔහුගේ මුල් ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මෙම පනතේ කර්තව්‍යය ඉටුකිරීම වෙනුවෙන් කමිටුවේ සාමාජිකයන් සඳහා මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය.

කමිටුව දත්ත පද්ධතියක් පිහිටුවීම.

**8.** (1) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ ආකෘතියෙන් සහ ආකාරයෙන් කමිටුව විසින් දත්ත පද්ධතියක් පිහිටුවීම හා පවත්වාගෙන යාම කළ යුතු ය.

(2) දත්ත ඇතුළත් කිරීමේ අරමුණ සඳහා එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම දත්ත පද්ධතිය (මෙහි මින් මතු "කලාපීය දත්ත පද්ධතිය" යනුවෙන් හඳුන්වනු ලබන) පිහිටුවනු ලැබිය යුතු ය. අදාළ ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය පදනම් කරගෙන දත්ත පද්ධතිය සඳහා තොරතුරු ඇතුළත් කළ යුතු ය.

(3) සියලු කලාපීය දත්ත පද්ධතීන් සභාපතිවරයාගේ දත්ත පද්ධතිය හා සම්බන්ධ කළ යුතු ය. දත්ත අවුරුදු දහයක කාලසීමාවක් සඳහා සංරක්ෂණය කළ යුතු ය.

අනුකමිටුව පත් කිරීම සහ කර්තව්‍යය.

**9.** (1) කමිටුව විසින් කටයුතු කාර්යක්ෂමව කිරීම සඳහා අවශ්‍ය යයි සලකන අවස්ථාවක දී මෙම පනත ප්‍රකාර වූ ඉල්ලුම් පත්වල සඳහන් කරුණු පිළිබඳව නිරවද්‍යතාව නිරීක්ෂණය කිරීම සඳහා කමිටුවේ සාමාජිකයන් අතරින් අනු කමිටුවක් පත් කළ හැක.

(2) කමිටුවේ සභාපතිවරයා අනු කමිටුවේ සභාපති ලෙස කටයුතු කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා සභාපතිවරයා විසින්-

(i) රජයේ ඉඩම පිහිටා ඇති ප්‍රදේශය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයාගෙන්;

(ii) රජයේ ඉඩම පිහිටා ඇති අදාළ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාගේ නියෝජිතයකුගෙන්;

(iii) රජයේ ඉඩම පිහිටා ඇති අදාළ පළාත් සභාවේ පළාත් ඉඩම් කොමසාරිස්වරයාගෙන්; හෝ

(iv) රජයේ ආයතනයක යම් නිලධරයකුගෙන්,

තොරතුරු ඉල්ලා සිටිය හැකි ය.

**අනු කමිටුව වාර්තා ඉදිරිපත් කිරීම.**

**10.** (1) අනු කමිටුව විසින් එක් මසක් ඇතුළත දී කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(2) අනු කමිටුව විසින්-

(අ) ඉදිරිපත් කර ඇති ලේඛනවල නිරවද්‍යතාව තහවුරු කිරීම;

(ආ) රජයේ ඉඩම 4 වන වගන්තිය යටතේ වන ප්‍රදේශයක් තුළ පිහිටා ඇත්නම් එය නිරීක්ෂණය කිරීම; සහ

(ඇ) අවශ්‍ය විටකදී ලිඛිතව සියලුම පාර්ශ්වයන් සඳහා නියෝජනය කිරීමට අවස්ථාව සලසා දීම,

කළ යුතු ය.

## III වන කොටස

## ඉල්ලුම් කිරීමේ ක්‍රියා පටිපාටිය

**පරම ඉඩම් ප්‍රදානය සඳහා ඉල්ලුම් කිරීම සඳහා වන දැන්වීම.**

**11.** (1) කමිටුව විසින්, පරම ඉඩම් ප්‍රදාන පත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලෙස දක්වමින් සභාපතිවරයාගේ අත්සනින් යුත් නිවේදනයක් ගැසට් පත්‍රයේ සහ අවම වශයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත් පතක පළ කළ යුතු ය.

(2) කමිටුව විසින්, මුද්‍රිත, ශ්‍රව්‍ය සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය මගින් නිවේදනය සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දීමට කටයුතු සැලැස්විය යුතු අතර, අවශ්‍ය විය හැකි පරිදි අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහාය ද ඇතිව අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ එම දැන්වීම සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දීම සඳහා ද කටයුතු සැලැස්විය යුතු ය.

(3) එකී නිවේදනයේ පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය-

(අ) 3 වන වගන්තිය යටතේ වන ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම සඳහා වන සුදුසුකම් සඳහා වන නිර්ණායක;

(ආ) 4 වන වගන්තියේ සඳහන් රජයේ ඉඩම් මෙම පනත අදාළ වන රජයේ ඉඩම් වලට ඇතුළත් නොවන බව;

(ඇ) 5 වන වගන්තිය යටතේ ඉල්ලුම්කරුවකුවීම සඳහා වන නුසුදුසුකම්;

(ඈ) ඉල්ලුම්පත්‍රය ලබාගත හැකි ස්ථාන;

(ඉ) ඉල්ලුම්පත්‍රය භාරදීමට ඇති කාලසීමාව;

(ඊ) ඉල්ලුම්කරු විසින් භාරදිය යුතු පහත දැක්වෙන ලේඛන:-

(i) ප්‍රදානයේ හෝ නීයාදන සාධන පත්‍රයේ සහතික කළ පිටපත් තුනක් සහිතව මුල් පිටපත මිනින්දෝරු සැලැස්මක් නොමැති අවස්ථාවක දී අතිරේක සහතික කළ පිටපතක් භාරදිය යුතු ය;

(ii) ඉල්ලුම්පත්‍රය භාරදීමට පෙර අවම වශයෙන් මාස හයක් ඇතුළත දී අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් ලබාගත් ඉල්ලුම්කරු සම්බන්ධයෙන් වූ ලියාපදිංචි ප්‍රදාන පත්‍රයේ හෝ නීයාදන සාධන පත්‍රයේ සහතික කරන ලද පිටපතක් සහ අතිරේක පිටපතක්;

(iii) නගරයේ සිට ඉඩමට පිවිසිය හැකි ළඟම මාර්ගය නිරූපණය කරන සටහනක් සහ එවැනි මිනින්දෝරු සැලැස්මක් නොමැති විට දී එකී පිවිසෙන මාර්ග සටහනේ අතිරේක පිටපතක්;

(iv) උප්පැන්න සහතිකවල සහතික කළ පිටපත් දෙකක්;

(v) මරණ සහ විවාහ සහතික ඇතුළත්ව අදාළ වෙනත් ලේඛනවල සහතික කළ පිටපත් දෙකක්;

(vi) ප්‍රදානයේ හෝ නීයාදන සාධන පත්‍රයේ දක්වා ඇති පරිදි අදාළ ඉඩම් ප්‍රමාණය සඳහා සකසන ලද මිනින්දෝරු සැලැස්මක් ඇත්නම් එහි මුල් පිටපත සහ සහතික කළ පිටපත් හතරක්, එසේ නැතහොත් අදාළ මුදල ගෙවීමෙන් පසුව අවශ්‍ය මිනින්දෝරු සැලැස්ම ලබා ගැනීම;

(vii) ඉල්ලුම්කරුගේ නම, සම්බන්ධකර ගැනීම සඳහා වන තොරතුරු සහ ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දක්වන ලද ලිපිගොනු පහක්.

**පරම ඉඩම් ප්‍රදාන සඳහා වන ඉල්ලුම්පත්‍ර.**

**12.** (1) ඉල්ලුම්කරු විසින්, 4 වන හා 5 වන වගන්තිවලට යටත්ව, 3 වන වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රමාණය සඳහා පරම ඉඩම් ප්‍රදානයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය.

(2) ඉල්ලුම්කරු විසින් එකී ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ නිශ්චිතව සඳහන් කරන ලද ලේඛන සමග අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

**ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඉල්ලුම්පත් සම්බන්ධයෙන් වාර්තා සකස් කිරීම.**

**13.** (1) ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 11 වන වගන්තිය යටතේ දක්වා ඇති සියලු ලේඛනයන්ගේ පිරික්සුම් ලැයිස්තුවක් පවත්වාගෙන යා යුතු ය. ඉල්ලුම්පත්‍රය සහ ලේඛන ලැබීමෙන් පසු, ප්‍රාදේශීය ලේකම්වරයා විසින්-

(අ) වෙනත් යම් අවශ්‍ය ලේඛන ඉල්ලා සිටිනු ලැබිය යුතු ය;

(ආ) මිනින්දෝරු සැලැස්ම සහිතව හෝ රහිතව, කලාපීය දත්ත පද්ධතියට අදාළ විස්තර ඇතුළත් කර ඇති බවට තහවුරු කරනු ලැබිය යුතු ය;

(ඇ) මුල් පිටපත ලද බව තහවුරු කරමින්, උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි සිය අත්සන යටතේ වූ පිටසනක් සමග ප්‍රදානයේ හෝ නීයාදන සාධන පත්‍රයේ පිටපතක් ඉල්ලුම්කරු වෙත භාරදෙනු ලැබිය යුතු ය;

(ඈ) (i) මිනින්දෝරු සැලැස්මක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක; හෝ

(ii) ඉඩම සඳහා 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයක අදාළ වන අවස්ථාවක,

මෙම පනත යටතේ නියමිත ගාස්තු ගෙවීම මත මිනින්දෝරු සැලැස්මක් සැකසීම සඳහා මිනුම්පතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කළ යුතු ය.

(2) නියෝගය මගින් නියම කරනු ලබන පරිදි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් වාර්තාවක් සකස් කළ යුතු ය. ප්‍රාදේශීය ලේකම්වරයා විසින්, සියලු ලේඛන ලැබීමෙන් මාස දෙකක කාල සීමාවක් ඇතුළත, අදාළ සියලු ලේඛන සමග වාර්තාව කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පැවරිය යුතු කාර්යයන්.

**14.** ප්‍රාදේශීය ලේකම්වරයා විසින්:-

(අ) ඔහුට අදාළ ප්‍රදේශය තුළ පනත අදාළ නොවන්නා වූ 5 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් සම්බන්ධයෙන් තොරතුරු ලේඛනයක් සකස් කිරීම;

(ආ) කමිටුව විසින් විධාන කරන පරිදි ලේඛන පවත්වාගෙන යාම;

(ඇ) සියලු ලේඛන, වාර්තා සහ දත්ත සටහන් කිරීම නිවැරදිව සිදුකර ඇති බව සහ ඒවා ක්‍රමානුකූලව පවත්වාගෙන යන බවට සහතික කිරීම;

(ඈ) නිශ්චිත කාලසීමාවක් ඇතුළත දී කමිටුව වෙත වාර්තා ලබා දීම;

(ඉ) කලාපීය දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම;

(ඊ) අවශ්‍ය පරිදි පනතේ කාර්ය සඳහා ක්ෂේත්‍ර චාරිකා සිදු කිරීම;

(උ) ඉල්ලුම්කරු විසින් භාරදෙනු ලැබ, භාරයේ තිබෙන සියලුම ඉල්ලුම්පත්‍ර සහ ලේඛන සුරක්ෂිතව තබා ගත යුතු අතර, මෙම පනතේ විධිවිධාන සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් කරුණු,

සිදුකළ යුතු ය.

මිනින්දෝරු සැලසුම් සකස් කිරීමේ දී මිනුම්පතිවරයා විසින් සහාය දැක්වීම.

**15.** (1) මිනුම්පතිවරයා විසින්, 13(1) (ඈ) වගන්තියේ කාර්ය සඳහා මිනින්දෝරු සැලැස්මක් ඇඳීම සඳහා යම් ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකුගේ සේවය ලබා ගත හැකි ය. එකී ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයා විසින්, මැනුම් කටයුතු සඳහා වූ මිනුම්පතිවරයාගේ ඉල්ලීම ලැබී මාස තුනක් ඇතුළත මැනුම් කටයුතු සිදුකර මිනින්දෝරු සැලැස්මේ පිටපත් හතරක් සැදිය යුතු ය. මිනුම්පතිවරයා විසින් අමතර පිටපතක් තබාගත යුතු ය.

(2) මිනින්දෝරු සැලැස්ම සහතික කිරීම සඳහා මිනුම්පතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. මිනුම්පතිවරයා විසින් එකී මිනින්දෝරු සැලැසුම් ප්‍රාදේශීය ලේකම් වෙත යැවිය යුතු ය.

ලේඛන රඳවා ගැනීම සහ විනාශ කිරීම.

**16.** (1) ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පිළිගනු ලැබූ යම් ලේඛනයක්, ලේඛනයේ ඇතුළත් සටහන් සඳහා ආධාර කර ගත හැකි දුරට සහ ඉන් පසුව අවුරුදු දහයක කාලයක් සඳහා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා ගැනීම සිදුකළ යුතු ය.

(2) හිමිකම් සඳහා අදාළ වන ලේඛනවල සටහන් කිරීමෙන් අවුරුදු දහයක් ඉක්ම ගිය විට, ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියෝග මගින් නියම කරනු ලබන පරිදි සහ එහි සඳහන් ආකාරයට එම ලේඛන විනාශ කළ හැකි ය. ඒ සඳහා බලපාන සටහන් ලේඛනයේ ඇතුළත් කළ යුතු ය.

කමිටුව විසින් ඉල්ලුම් පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

**17.** (1) කමිටුව විසින් ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයෙන් ලැබෙන එක් එක් ඉල්ලුම්පත සහ අදාළ සියලු ලේඛන පරීක්ෂා කළ යුතු ය. කමිටුව විසින් සෑහීමකට පත්වන්නේ නම් එහි නිරීක්ෂණ ලිඛිතව සිදුකළ යුතු ය.

(2) කමිටුව විසින් අවශ්‍ය විට දී, ඒ පිළිබඳ වාර්තා කිරීම සඳහා එම කරුණ 10 වන වගන්තිය යටතේ පත්කළ අනුකමිටුව වෙත ඉදිරිපත් කළ හැකි ය. කමිටුව විසින් වාර්තාව සලකා බැලිය යුතු අතර සෑහීමකට පත්වන්නේ නම් නිරීක්ෂණ ලිඛිතව සිදුකළ යුතු ය.

(3) කමිටුව විසින්, කලින් කල සංශෝධනය කළ යුතු වන 11 (3) (ඊ) වන වගන්තිය යටතේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඉල්ලුම්පත්‍ර සඳහා වන ලැයිස්තුවක් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා පිළියෙල කළ යුතු ය.

(4) කමිටුව විසින් සෑහීමකට පත් නොවන අවස්ථාවක දී ලිඛිතව ඉල්ලුම්කරුව දැනුවත් කළ යුතු ය.

## IV වන කොටස

## විරෝධතා

විරෝධතා.

**18.** (1) කමිටුව විසින්, 17(3) වන වගන්තිය යටතේ ඉල්ලුම්කරුවන්ගේ ලැයිස්තුව ඇතුළත්වන සභාපතිවරයාගේ අත්සනින් යුක්ත වූ නිවේදනයක් නියෝග මගින් නියම කර ඇති පරිදි *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු ය. එම නිවේදනය, මහජනතාවට දැනුම් දීම සඳහා සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් පළවන පුවත් පතක පළකළ යුතු අතර, විරෝධතා පවතී නම් ඒවා ඉදිරිපත්

කිරීම සඳහා මහජනතාවට අවස්ථාව ලබාදිය යුතු ය. 19 වන වගන්තිය යටතේ පත් කරනු ලබන මණ්ඩලය විසින් විරෝධතා සලකා බැලිය යුතු ය.

(2) විරෝධතා සඳහා වන නිවේදනයේ—

(අ) විරෝධතා ඉදිරිපත් කළ යුතු ආකාරය සහ ස්ථානය;

(ආ) විරෝධතා ඉදිරිපත් කළ හැකි කාලසීමාව; සහ

(ඇ) කමිටුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් කාරණා,

ඇතුළත් විය යුතු ය.

**මණ්ඩල පත්කිරීම.**

**19.** (1) අමාත්‍යවරයා විසින්, කමිටුව විසින් නම් කරන, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා අවශ්‍ය විය හැකි පරිදි යම් මණ්ඩල සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් විරෝධතා සලකා බැලිය යුතු අතර, කමිටුවට වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

(3) (අ) සෑම මණ්ඩලයක් ම, කමිටුව විසින් නම් කරනු ලබන ඉඩම් කාරණා පිළිබඳව පළපුරුද්දක් ඇති නීතිඥ වෘත්තිකයන් අතරින් එක් තැනැත්තකුගෙන් සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියට වඩා ඉහළ නිලයක් දරන විශ්‍රාමික රජයේ නිලධරයන් දෙදෙනකුගෙන් සමන්විත යුතු ය. මණ්ඩලයේ එක් එක් සාමාජිකයකු ම වයස අවුරුදු හැත්තෑව නොයික්ම විය යුතු ය;

(ආ) හැකි අවස්ථාවක දී මණ්ඩලයට අවම වශයෙන් එක් කාන්තා නිලධාරිනියක් ඇතුළත් විය යුතු ය.

(4) මණ්ඩලයේ සභාපති නීතිඥ වෘත්තියෙන් තෝරාගනු ලබන තැනැත්තා විය යුතු අතර, මණ්ඩලයේ සෑම රැස්වීමක දී ම සභාපතිවරයා මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී පැමිණ සිටින සාමාජිකයන් අතරින් රැස්වීම් සඳහා සභාපතිවරයකු තෝරා පත් කර ගත යුතු ය.

(5) මණ්ඩලය විසින් තීරණය කළ යුතු සියලු කරුණු මණ්ඩලයේ රැස්වීමක දී සලකා බැලිය යුතු අතර, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. මණ්ඩලයේ සියලු තීරණ හේතු සහිතව විය යුතු අතර, ලිඛිත විය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින්, නියෝග මගින් නියම කරනු ලැබිය යුතු, මණ්ඩලයේ කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

(7) මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික ප්‍රමාණයක් මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් ඕනෑම අවස්ථාවක දී ස්වකීය අත්සනින් යුතුව අමාත්‍යවරයා අමතනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරය හිස් කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් (3) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් මණ්ඩලයට වෙනත් සාමාජිකයකු පත් කළ හැකි ය.

මණ්ඩලයේ නිර්දේශ.

**20.** සියලු පාර්ශ්වයන්ට සවන් දී අදාළ කරුණ විමර්ශනය කිරීමේ දී, මණ්ඩලයේ සාමාජිකයන් විසින් ලේඛන ඉල්ලා සිටීම, තොරතුරක් සලකා බැලීම සහ විරෝධතා ඉදිරිපත් වී මාස තුනක් ඇතුළත එහි නිර්දේශ කමිටුව වෙත ඉදිරිපත් කිරීම කළ යුතු ය.

කමිටුව විසින් මණ්ඩලයේ නිර්දේශ සලකා බැලීම.

**21.** කමිටුව විසින්, විරෝධතා සම්බන්ධයෙන් එහි තීරණයක් ගැනීමේ දී මණ්ඩලයේ නිර්දේශ සලකා බැලිය යුතු අතර, කමිටුවේ තීරණයට එරෙහිව විරෝධතා ඉදිරිපත් කර ඇති තැනැත්තා වෙත නොපමාව දැනුම් දිය යුතු ය. කමිටුවේ තීරණයට එරෙහිව සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට යටත්ව, කමිටුවේ තීරණය අවසානාත්මක විය යුතු ය. සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, කමිටුව විසින් සමාලෝචන මණ්ඩලයේ තීරණය මත කටයුතු කළ යුතු ය.

## V වන කොටස

### සමාලෝචන මණ්ඩලය

**22.** (1) 17(4) වන වගන්තිය යටතේ කමිටුව ගත් තීරණවලින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඔහුට ඒ තීරණය දැනුම් දුන් දිනයේ සිට දින තිහක් ඇතුළත ඒ තීරණයට එරෙහිව කමිටුවට පිටපතක් සහිතව සමාලෝචන මණ්ඩලයට අභියාචන කළ හැකි ය. සමාලෝචන මණ්ඩලය විසින් කමිටුවේ තීරණය වෙනස් කිරීම, ප්‍රතිවර්තනය කිරීම හෝ ස්ථිර කිරීම කළ හැකි ය.

(2) සමාලෝචන මණ්ඩලයට අභියාචනයක් සිදුකර ඇති අවස්ථාවක දී කමිටුව විසින් සමාලෝචන මණ්ඩලයේ තීරණය ලැබෙන තෙක් සිටිය යුතු අතර, එම තීරණය අනුව කටයුතු කළ යුතු ය.

සමාලෝචන මණ්ඩලය පත් කිරීම.

**23.** (1) සමාලෝචන මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කළ යුතු අතර, පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) අභියාචනා අධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයකු;

(ආ) විශ්‍රාමික ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු හෝ අතිරේක රෙජිස්ට්‍රාර්වරයකු හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයකු; සහ

(ඇ) ඉඩම් කාරණා සම්බන්ධව අතිරේක ලේකම්වරයකු ලෙස සේවය කර ඇති විශ්‍රාමික රාජ්‍ය නිලධරයකු හෝ ඉඩම් කාරණා සම්බන්ධයෙන් වසර දහයකට වැඩි පළපුරුද්දක් ඇති වෙනත් තැනැත්තකු.

(2) අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයා සමාලෝචන මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, සභාපතිවරයා සමාලෝචන මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එම රැස්වීම සඳහා සභාපතිවරයකු තෝරාගත යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, නියෝග මගින් නියම කළ යුතු වූ, සමාලෝචන මණ්ඩලයේ කටයුතු සිදුකිරීම සම්බන්ධ මාර්ගෝපදේශ නිකුත් කළ හැකි ය.

(4) මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකිය. පාරිශ්‍රමික ප්‍රමාණයක් සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

(5) සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයකු විසින් ඕනෑම අවස්ථාවක දී ස්වකීය අත්සනින් යුතුව අමාත්‍යවරයා අමතනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරය හිස් කරනු ලැබිය හැකි අතර අමාත්‍යවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) සමාලෝචන මණ්ඩලයේ යම් සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම මගින් පුරප්පාඩුවක් සිදු වූ අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් වෙනත් යම් තැනැත්තකු සමාලෝචන මණ්ඩලයට පත් කළ යුතු ය.

(7) සමාලෝචන මණ්ඩලයේ තීරණය සඳහා වන සියලු කරුණු සමාලෝචන මණ්ඩලයේ රැස්වීමක දී සලකා බැලිය යුතු අතර, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

(8) සමාලෝචන මණ්ඩලයේ සියලු තීරණ හේතු සහිත විය යුතු අතර ලිඛිත විය යුතු ය.

සමාලෝචන මණ්ඩලයේ තීරණය කමිටුවට දැනුම් දීම ආදිය.

**24.** සමාලෝචන මණ්ඩලය විසින් කාරණයට අදාළ සියලු ලේඛන පරීක්ෂා කළ යුතු අතර, එම කරුණු විමර්ශනය කළ යුතු ය. එකී සමාලෝචන මණ්ඩලය විසින්, අභියාචනය ලැබුන දින සිට මාස දෙකක් ඇතුළත එහි තීරණය කමිටුව වෙත සහ අභියාචකට දැනුම් දිය යුතු ය. එහි තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු ය.

## VI වන කොටස

## පරම හිමිකම නිකුත්කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටිය

කමිටුව අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

**25.** (1) කමිටුව විසින්-

(අ) මණ්ඩලයේ නිර්දේශ; සහ

(ආ) සමාලෝචන මණ්ඩලයේ තීරණය,

ඇතුළුව පරම ඉඩම් ප්‍රදානය සඳහා වන සියලු ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් කමිටුවේ නිර්දේශ සහ අදාළ ලේඛන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

**පරම ඉඩම් ප්‍රදාන පිළිබඳ ජනාධිපතිවරයා විසින් තීරණ ගැනීම.**

**26.** (1) අමාත්‍යවරයා විසින්, නිර්දේශ සහ අදාළ ලේඛන ලැබුණු පසුව සහ ඒවායේ නිරවද්‍යභාවය පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසුව ප්‍රායෝගිකව හැකි ඉක්මනින් ඒ නිර්දේශ සහ ලේඛන ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින්, ඔහු වෙත භාරදුන් නිර්දේශ සහ ලේඛන සැලකිල්ලට ගනිමින්, පරම ඉඩම් ප්‍රදානයන් නිකුත් කිරීම සම්බන්ධයෙන් තීරණය ගත යුතු ය. එකී ප්‍රදානයන්ට රජයේ මුද්‍රාව තැබිය යුතු ය.

**පරම ඉඩම් ප්‍රදානයන් ලියාපදිංචි කිරීම.**

**27.** (1) ජනාධිපතිවරයා විසින් නිකුත් කරන පරම ඉඩම් ප්‍රදානය සඳහා අගනා ප්‍රතිෂ්ඨාවක් අයකිරීම නොකළ යුතු ය.

(2) කමිටුව විසින්, ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද පරම ඉඩම් ප්‍රදාන ලියාපදිංචි කිරීම සඳහා අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට ඉදිරිපත් කළ යුතු ය.

(3) කමිටුව විසින්, ලියාපදිංචි පරම ඉඩම් ප්‍රදානයන් අදාළ ප්‍රදානලාභියාට භාරදීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඉදිරිපත් කළ යුතු ය. එහි සහතික කළ පිටපතක් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා වෙත ලබාදිය යුතු ය.

**ප්‍රදාන සහ නීයාදන සාධනපත්‍ර අවලංගු කිරීම.**

**28.** අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය විසින් පරම ඉඩම් ප්‍රදානය ලියාපදිංචි කිරීම මත ප්‍රදාන හෝ නීයාදන සාධන පත්‍ර ස්වයංක්‍රීයව අවලංගු වී ඇති බවට සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, 3 (1) වන වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන සලසා ඇති පරිදි යම් ඉඩමක් අක්කර පහක ප්‍රමාණය ඉක්මවන විට දී, එම ඉඩමේ ඉතිරි ප්‍රමාණය සඳහා අදාළ නීති යටතේ අලුත් ඉඩම් ප්‍රදානයක් හෝ නීයාදන සාධන පත්‍රයක් නිකුත් කළ යුතු ය.

**ප්‍රදානලාභියා විසින් ගැණුම්කරුවකුට ඉඩම් පැවරීම.**

**29.** (1) පරම ඉඩම් ප්‍රදානය හිමි ප්‍රදානලාභියාට අදාළ ඉඩම උරුමක්කාරයන්ට පැවරීම හෝ සියලු උරුමක්කාරයන්ගේ ලිඛිත එකඟත්වය ඇතිව වෙනත් තැනැත්තකුට විකිණීමට අයිතිය තිබිය යුතු යඃ

එසේ වුව ද, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 53 වන වගන්තියට අනුව ලියාපදිංචි කරන ලද කුඹුරු වගා කිරීම සඳහා භාවිතා කරන යම් ඉඩමක් බෙදා වෙන් කිරීම සඳහා පරම ඉඩම් ප්‍රදානයක ප්‍රදානලාභියා හිමිකම් නොලැබිය යුතු යඃ

එසේ වුව ද, තව දුරටත් කුඹුරු වගා කිරීම සඳහා භාවිතා කරන යම් ඉඩමක්-

(i) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 38 වන වගන්තිය යටතේ පත් කරන ලද ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ ගොවිජන හැඳුනුම් පතක් සහ අවුරුදු දෙකක් ඇතුළත වූ ඉල්ලුම්කරුගේ ලියාපදිංචි සාමාජිකත්වයේ සහතික කළ පිටපතක් දරන්නකුට; සහ

(ii) රජයේ ඉඩම් පිහිටා ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හෝ යාබද ග්‍රාම නිලධාරි කොට්ඨාසයක ලියාපදිංචි ඡන්දදායකයකු වන බවට තහවුරු කරන ලද,

යම් ගැණුම්කරුවකුට විකිණිය හැකි අතර, අදාළ ගැණුම්කරුට එකී ඉඩම සියලු උරුමක්කරුවන්ගේ ලිඛිත එකඟත්වය ඇතිව මිලදී ගත හැකි ය.

(2) මේ වගන්තිය යටතේ අන්සතු කිරීමක් ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා-

(අ) නොතාරිස්වරයකු විසින් ලියා අත්සන් කළ පැවරුම් ඔප්පුව-

(i) (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතේ විධිවිධාන අනුව විය යුතු ය; සහ

(ii) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද කරුණු තහවුරු කළ යුතු ය;

(ආ) ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා හෝ හිමිකම් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කිරීම සඳහා පැවරුම් ඔප්පු භාරදෙනු ලබන විට (අ) ඡේදයේ සැලකිල්ලට ගත යුතු ය; සහ

(ඇ) පසුව සිදුකරන්නා වූ පැවරීම් පරීක්ෂා කිරීම පිණිස කමිටුව විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ලබාදෙන ලද පරම ඉඩම් ප්‍රදානයේ පිටපතක් තබාගත යුතු ය.

**30.** සැක දුරුකිරීමේ කාර්ය සඳහා මෙමඟින් ප්‍රකාශ කර සිටින්නේ- සැක දුරුකිරීම.

(අ) මේ පනත යටතේ ජනාධිපතිවරයා විසින් ප්‍රදානය කරනු ලබන පරම ඉඩම් ප්‍රදාන පත්‍රය එම ඉඩම සඳහා පරම හිමිකාරත්වය තීරණය කිරීමේ සාක්ෂියක් විය යුතු ය; සහ

(ආ) පරම ඉඩම් ප්‍රදාන පත්‍රය යම් ගනුදෙනුවක්, කටයුත්තක්, හිමිකම් පැවරීමක්, බැඳුම්කරයක් සඳහා වූ ඇපයක් හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඕනෑම අධිකරණයක්, ආයතනයක් හෝ අධිකාරියක් ඉදිරිපිට දී ආවේශ්‍ය සහ වලංගු විය යුතු ය.

VII වන කොටස

**සාමාන්‍ය**

**31.** මෙම පනතේ විධිවිධාන පරිපාලනය කිරීමේ දී කමිටු සාමාජිකයකු හෝ මණ්ඩලයේ සාමාජිකයකු හෝ සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයකු හෝ වෙනත් යම් නිලධරයකු පරම ඉඩම් ප්‍රදානය සඳහා වන ඉල්ලුම්කරුවකු හා සම්බන්ධ යම් කරුණක් සඳහා සම්බන්ධතාවයක් පවතී අවස්ථාවක දී එම සම්බන්ධතාවයේ ස්වභාවය අදාළ කරුණ සඳහා වෙනත් තැනැත්තකු පත් කිරීමට අවශ්‍ය කටයුතු සැලැස්වීම සඳහා සභාපතිවරයාට හෝ එම කරුණ සඳහා වෙනත් තැනැත්තකු පත්කිරීම සඳහා අමාත්‍යවරයාට දැක්විය යුතු ය. සම්බන්ධතාවන් හෙළි කිරීම.

**32.** (1) සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ම ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් කමිටුව විධාන කරන පරිදි වසරකදී කාර්තු හතර සඳහා වාර්තා ඉදිරිපත් කළ යුතු ය. මෙම පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල පරාසය තුළ සිදු වූ ප්‍රගතිය, අගයන ලද ඉල්ලුම් පත්‍ර ප්‍රමාණය සහ පත් කරන ලද මණ්ඩල පිළිබඳව තොරතුරු වාර්තාවේ ඇතුළත් විය යුතු ය. ලබාදිය යුතු වාර්තා.

(2) කමිටුව විසින් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිදුකරන ලද කාරණාවල අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තාවක් වගුවක් මගින් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය. වාර්තාව මගින්, පසුව

එළඹෙන අර්ධ වාර්ෂික කාලසීමාව තුළ දී පනත යටතේ වන කරුණු ඉටු කරනු ලැබිය යුතු වූ කාලපරාසයන් පිළිබඳව අනුමාන කරනු ලැබිය යුතු ය. එම වාර්තාව අමාත්‍යවරයා විසින් වාර්ෂිකව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

නියෝග.

33. (1) අමාත්‍යවරයා විසින් මෙම පනතේ ප්‍රතිපත්තීන් සහ විධිවිධාන බලාත්මක කිරීම සඳහා හෝ මේ පනත මඟින් නියම කළයුතු බවට දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීම සඳහා බලය ලබා දී ඇති කරුණු සම්බන්ධයෙන්, නියෝග සාදනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගති විරහිතව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය—

(අ) 26 වන වගන්තිය යටතේ දක්වා ඇති පරම ඉඩම් ප්‍රදාන පත්‍රය සඳහා වන ඉල්ලුම්පත්‍රයේ ආකෘතිය;

(ආ) තවදුරටත් ලේඛන සංරක්ෂණය කිරීම සඳහා මෙම පනත යටතේ ලේඛන සංරක්ෂණය කළ යුතු බවට වූ නිශ්චිතව දක්වා ඇති කාල පරිච්ඡේදය සම්බන්ධයෙන්;

(ඇ) ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ලේඛන ඉදිරිපත් කිරීමේ දී සැකසිය යුතු ලිපිගොනු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබීමේ දින සිට හෝ නියෝග මගින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් පසු දිනයක සිට එම නියෝග බලාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබීමේ දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) එසේ අනුමත නොවූ සෑම නියෝගයක් ම එම අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගති විරහිතව පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) එසේ නියෝගය පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

**34.** ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රදාන පත්‍රයක හෝ නීයාදන සාධන පත්‍රයක පිටපතෙහි සිදුකරන ලද පිටසන සෑම කාර්යයක් සඳහා වලංගු විය යුතු ය.

අර්ථ නිරූපණය.

**35.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස-

"ජනපද ව්‍යාපාර" සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් රජයේ ඉඩම්වල පවුල් පදිංචි කරවීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ද ඇතුළත් වේ;

"රජයේ ඉඩම් ආඥාපනත" යන්නෙන්, (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනත අදහස් වේ;

"ප්‍රාදේශීය ලේකම්" යන්නෙන්, 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත යටතේ වන ඉඩම පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් අදහස් වේ;

"තොරතුරු" සඳහා වාචික හෝ ලේඛන සාක්ෂි ඇතුළත් වේ;

"ඉඩම් කොමසාරිස්" යන්නෙන්, (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ පත් කළ ඉඩම් කොමසාරිස් අදහස් වේ;

"ඉඩම් සංවර්ධන ආඥාපනත" යන්නෙන්, (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත අදහස් වේ;

"ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත" යන්නෙන්, 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත අදහස් වේ;

"ඉඩම් නිරවුල් කිරීමේ වැඩසටහන" සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ලද යම් නිරවුල් කිරීමේ වැඩසටහනක් ද ඇතුළත් වේ;

"පළාත් පාලන ආයතන" යන්නෙන්, (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත, (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනත හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ඇති නගර සභා, මහනගර සභා හෝ ප්‍රාදේශීය සභා අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන ව්‍යවස්ථාව යටතේ මෙම පනතේ විෂය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"තැනැත්තා" යන්නෙන්, පුරවැසියා අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග වලින් නියම කිරීම අදහස් වේ;

"ආරක්ෂිත කලාප" සඳහා-

(i) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත;

(ii) (696 වන අධිකාරය වූ) කැලෑ ආඥා පනත;

(iii) 1988 අංක 3 දරන ජාතික උරුම වන භූමි පනත;

(iv) (496 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත;

(v) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත;

(vi) (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත,

යටතේ විධිවිධාන මගින් රක්ෂිත හෝ ආරක්ෂිත යම් ඉඩමක් ඇතුළත් වේ;

"ආරක්ෂිත කලාප" සඳහා-

(i) 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත;

(ii) (453 වන අධිකාරය වූ) වාරිමාර්ග පනත;

(iii) (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥා පනත;

(iv) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත;

(v) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත;

(vi) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත;

(vii) (193 වන අධිකාරය වූ) මහාමාර්ග ආඥාපනත;

(viii) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත,

යටතේ විධිවිධාන මගින් රක්ෂිත හෝ ආරක්ෂිත යම් ඉඩමක් ඇතුළත් වේ;

"ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයා" යන්නට 2002 අංක 17 දරන මිනුම් පනතේ සඳහන් අර්ථය ම විය යුතු ය; සහ

"ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" සඳහා නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් හෝ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් ඇතුළත් විය යුතු ය.

**36.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

*උපලේඛනය*

[13(1)(ඇ) වන වගන්තිය]

**ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සිදුකරනු ලබන පිටසන**

............ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රදේශීය ලේකම් වන මා වෙත ............... දින භාර දෙන ලද ප්‍රදානයේ/ නීයාදන සාධනපත්‍රයේ මුල් පිටපතේ සත්‍ය පිටපතක් බව මේ මගින් සහතික කරමි.

....................................
අත්සන.
නිලමුද්‍රාව.